වාර්ෂික වාර්තාව

**ஆண்டறிக்கை**

# ANNUAL REPORT 2019

**ඉඩම් මැනුම් සභාව**

**நில அளவைச் சபை**

Land Survey Council


**ඉඩම් මැනුම් සභාව, සර්වේයර් ජනරාල් කාර්යාලය,අංක150, කොළඹ 05**

**நில அளவைச் சபை, நில அளவையாளர் அதிபதி அலுவலகம்,இல.150 பெர்னாட்கொழும்பு 05**

**Land Survey Council, Surveyor General's Office,No 150**

## පටුන

1. සභාපතිතුමියගේ පණිවුඩය 04

2. දැක්ම සහ මෙහෙවර 05

3. ඉඩම් මැනුම් සභාව 06

4. ඉඩම් මැනුම් සභාවේ කාර්යභාරයන් 07

5. ඉඩම් මැනුම් සභාව සතු බලතල 08

6. 2019 වර්ෂය තුළදී ඉඩම් මැනුම් සභාවේ කාර්යය සාධනය 08

7. ඉඩම් මැනුම් සභාවේ කාර්ය මණ්ඩලය 10

8. ඉඩම් මැනුම් සභාවේ ක්‍රියාකාරකම් 10

9. අධ්‍යයන හා පුහුණු වැඩ කටයුතු 15

10. මූල්‍ය කළමනාකරණය 17

11. 2019 වර්ෂය සඳහා අවසාන ගිණුම් ප්‍රකාශන (ඇමුණුම්)

   i). මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
   ii). මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය
   iii). ශුද්ධ වත්කම් බැරකම් ප්‍රකාශනය
   iv). මුදල් ගැලීම් ප්‍රකාශනය
   v). 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ සටහන
   vi). 2019 දෙසැම්බර් 31 දිනට පොදු ගිණුම් ප්‍රතිපත්ති

12. විගණකාධිපති වාර්තාව 2019

# 01.සභාපතිතුමියගේ පණිවුඩය

ඉඩම් මැනුම් සභාව
අංක150, බර්නාඩ් සොයිසා මාවත,
නාරාහේන්පිට, කොළඹ 05
2020.12. 20

2002 අංක 17 දරණ මැනුම් පනත තුළින් ඉඩම් මැනුම් සභාවට පැවරී ඇති කාර්යයන් හා බලතල ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රධාන වශයෙන් මිනින්දෝරුවරුන් ලියාපදිංචි කිරීම, ලියාපදිංචි මිනින්දෝරුවරුන් සඳහා වාර්ෂික මැනුම් බලපත්‍ර නිකුත් කිරීම, වෘත්තිමය මිනින්දෝරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ වෘත්තිමය විනය පාලනය මැනුම් සභාවේ වගකීම් වේ. එපමණක් නොව, ලියාපදිංචි මිනින්දෝරුවරුන්ට එරෙහිව මහජනයා ඉදිරිපත් කරන පැමිණිලි විභාග කිරීමත්, ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ තොරතුරු මහජනයා වෙත ලබා දීමත්, වෙනත් වෘත්තීයමය ආයතන සමඟ සමායෝජනය කිරීමත් ඉඩම් මැනුම් සභාවේ වගකීම් වලට අයත් ය. ගුණාත්මකව උසස් මැනුම් සේවාවක් සැපයීම වස් වෘත්තීයවේදීන් ශක්තිමත් කිරීමට 2019 වසර තුළ ඉඩම් මැනුම් සභාවට හැකියාවක් ලැබීම පිළිබඳ බෙහෙවින් සතුටුවෙමි.

සැම මිනින්දෝරු වෘත්තිකයෙකුම තම වෘත්තීය කටයුතු ක්‍රමවත්ව සහ නියමිත ප්‍රමිතීන්ට අනුව පවත්වා ගැනීමට උනන්දු කර වීමට සකස් කළ රෙගුලාසි අනුව මිනින්දෝරු වෘත්තියේ කටයුතු කිරීම සැම මිනින්දෝරු වෘත්තිකයෙකුට මෙන්ම පොදුවේ රටටම ප්‍රතිලාභ අත් වන්නක් බව මා තරයේ විශ්වාස කරමි. මෙම වාර්ෂික අත්හදා බැලීම් තුළින් ඉදිරිපත් වන කරුණු අනුව මේ වන විට පවතින රෙගුලාසි සංශෝධනය/ වැඩිදියුණුකර ගැසට් මගින් ප්‍රකාශ කිරීමට කටයුතු කරමින් පවතී.

ඉඩම් මැනුම් සභාව සඳහා www.landsurveycouncil.org නමින් වෙබ් අඩවියක් දියත් කර ඇති අතර වෘත්තිකයන් හා පොදුජනතාව අතරට යාම සඳහා වඩාත් සාර්ථක මාධ්‍යයක් ලෙස එය හඳුනා ගන්නා ලදී. මැනුම් සභාවේ ලියාපදිංචිය මෙන්ම තොරතුරු ලබාදීම වැනි කටයුතු ද වඩාත් කාර්යක්ෂමව මෙම වෙබ් අඩවිය හරහා සිදු කරනු ලැබේ.

ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය මෙන්ම වෘත්තිමය විනය පවත්වා ගැනීම උදෙසා 2019 වසරේදී ද ලියාපදිංචි මිනින්දෝරුවරුන් හට අඛණ්ඩ වෘත්තිමය සංවර්ධන පුහුණු පාඨමාලා කිහිපයක්ම අනුමත කොට පැවැත්වීමට ඉඩම් මැනුම් සභාව විශේෂයෙන් කටයුතු කර ඇත. එහිදී පාඨමාලාවලට සහභාගී වීම සඳහා අලුතින් ලියාපදිංචි මිනින්දෝරුවරුන් විසින් දක්වන ලද උනන්දුව කැපී පෙනුනි.

සමාලෝචිත කාල සීමාව තුළ සැම විටම පවතින කාර්ය මණ්ඩල හිඟයද අභිබවමින් ඉඩම් මැනුම් සභාව හොඳින් පවත්වාගෙන යාම සඳහා වැඩ බලන ලේකම්, ගණකාධිකාරී (අර්ධකාලීන) ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය මෙන්ම උප සභාපති ඇතුළු ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයන්ගෙන් ලැබුණු සහයෝගය සහ කැපවීම පිළිබඳ මාගේ ස්තූතිය පුදකරමි.

ඒ. එල්. එස්.සී. පෙරේරා

සභාපති

## 02. දැක්ම සහ මෙහෙවර

### දැක්ම

ඉඩම් මැනුම් සඳහා ක්‍රමවත් රාමුවක අඛණ්ඩතාව පවත්වා ගනිමින් ජාතික සංවර්ධනය උදෙසා අපගේ භෞතික හා ස්වභාවික සම්පත්වල ප්‍රශස්ත හා තිරසාර උපයෝගිතාව තහවුරුකර ඒ තුළින් තරඟකාරී ගෝලීය වෙළඳපොළ තුළ ගුණාත්මක මෙන්ම වෘත්තීය නිපුණත්වයෙන් යුත් මැනුම් සේවාවන් වෙත නාභිගත වී වෘත්තීයමය පරිසරය ශක්තිමත් කිරීම අපගේ දැක්ම වේ.

### මෙහෙවර

මැනුම් වෘත්තිය හා එහි ව්‍යවහාරයන් ක්‍රමවත්ව පවත්වාගන්නා බවටත්, වෘත්තියෙන් බලාපොරොත්තු වන්නා වූ තාක්ෂණික නියමයන් සහ සදාචාරමය ප්‍රමිතීන් වලට එකඟ වන ලෙස පුහුණුවක් හා අධ්‍යාපනයක් වෘත්තියට ප්‍රවේශ වන්නන් වෙත ලැබෙන බවටත්, එම නිසා වෘත්තියේ යෙදෙන්නන් විසින් වෘත්තීය පැවැත්මේ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගනු ලබන බව තහවුරු කිරීම ඉඩම් මැනුම් සභාවේ මෙහෙවර වේ.

## 03. ඉඩම් මැනුම් සභාව

2002 අංක 17 දරණ මැනුම් පනතේ සඳහන් විධි විධාන අනුව 2003 වර්ෂයේ මාර්තු මාසයේ දී කොළඹ 05, බර්නාඩ් ද සොයිසා මාවත, අංක 150 දරණ ලිපිනයේ පිහිටා ඇති සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ලේ පළමු මහල තුළ ඉඩම් මැනුම් සභාව ස්ථාපිත කරන ලද අතර 2019 වර්ෂයේ සිට මේ දක්වා එම ගොඩනැගිල්ලේ බිම් මහල තුළ ඉඩම් මැනුම් සභාව පවත්වා ගෙන එනු ලැබේ.

මැනුම් පනතේ 27 වැනි වගන්තිය යටතේ ඉඩම් මැනුම් සභාවේ සංයුතිය කෙසේ විය යුතු ද යන්න පිළිබඳව විධි විධාන සලස්වා ඇත. එකී විධි විධාන වලට අනුව ඉඩම් මැනුම් සභාව සාමාජිකයින් 7 දෙනෙකුගෙන් සමන්විත වන අතර එම සාමාජිකයින් පත් වන ආකාරය පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

(අ) නිලබලයෙන් පත්වන සාමාජිකයින්

i. සභාපති - සර්වේයර් ජනරාල් වරයා

ii. උප සභාපති - සර්වේයර් ජනරාල් විසින් නම් කරනු ලබන නියෝජ්‍ය සර්වේයර් ජනරාල්ට අඩු නොවන ධූරයක් දරණ ලියාපදිංචි මිනින්දෝරුවරයෙකු

iii. සාමාජික - 1969 අංක 21 මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතන පනත මගින් පිහිටුවා ඇති මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂකවරයා

(ආ) පත් කරන සාමාජිකයින්

i. සාමාජික `- 1982 අංක 22 දරණ ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත මගින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය විසින් නම් කරනු ලබන ඉඩම් මැනීම පිළිබඳ පුළුල් අත්දැකීම් හා ප්‍රත්‍යක්ෂ සාමාර්ථයන් දරණ මිනින්දෝරුවරුන් තිදෙනෙක්

ii. 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතින් පිහිටවූ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන, විශ්ව විද්‍යාලයක අධ්‍යාපන, පරිපාලන, කළමනාකරණ හෝ ඉංජිනේරු විද්‍යාව යන ක්ෂෙත්‍රයන් හි එක් විද්වතෙකු

iii. මෙම පත්කිරීම් අමාත්‍යවරයා විසින් කරනු ලැබේ.

## 04. ඉඩම් මැනුම් සභාව වෙත පැවරී ඇති කාර්ය භාර්යයන්

ඉඩම් මැනුම් සභාවේ කාර්යයන් මැනුම් පනතේ 37 වගන්තිය යටතේ පහත පරිදි දක්වා ඇත.

(අ) ඉඩම් මැනීමට අදාළ ප්‍රමිති හා කාර්ය පටිපාටිය පවත්වා ගෙන යාම හා ඉඩම් මැනීමේ කටයුතුවල යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තීමය විනය පවත්වාගෙන යාම.

(ආ) ලියාපදිංචි මිනින්දෝරුවරු ලෙස ලියාපදිංචි කිරීම සඳහා මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර බාරගැනීම සහ ඒ මිනින්දෝරුවරුන්ට ඉඩම් මැනීමේ කටයුතු කරගෙන යාම සඳහා නියමිත සුදුසුකම් සහ පළපුරුද්ද සහ හැකියාව සහ නිපුණතාවය ඇති බවට සභාව සෑහීමකට පත්වන අවස්ථාවන්හි ඔවුන් ලියාපදිංචි කිරීම.

(ඇ) වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර බාර ගැනීම සහ ඉඩම් මැනීමේ වෘත්තියෙහි යෙදීමට එම මිනින්දෝරුවරුන්ට දැනුම හා දක්ෂතාවය ඇති බවට සභාව සෑහිමට පත්වන අවස්ථාවන්හි ඔවුන්ට එම බලපත්‍ර නිකුත් කිරීම.

(ඈ) ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තීයමය අධ්‍යාපනය පිළිබඳ උසස් ප්‍රමිතීන් පවත්වාගෙන යාම ප්‍රවර්ධනය කිරීම.

(ඉ) මිනින්දෝරු වෘත්තියේ යෙදී සිටින සහ වාර්ෂික වෘත්තීය බලපත්‍ර ලබා ගැනීමට නියම කරන ලද තැනැත්තන්ගේ දැනුම හා දක්ෂතා වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා වෘත්තීමය සංවර්ධන වැඩ සටහන් ප්‍රවර්ධනය කිරීම.

(ඊ) ඉඩම් මැනීම පිළිබඳ ශාස්ත්‍රීය හා වෘත්තීමය සුදුසුකම් පිළිගැනීම, ප්‍රායෝගික පළපුරුද්ද පිළිබඳ අවශ්‍යතා නියම කිරීම සහ ලියාපදිංචි මිනින්දෝරුවරුන් ලෙස ලියාපදිංචි වීමට සහ වාර්ෂික වෘත්තීමය බලපත්‍ර නිකුත් කිරීම සඳහා වු අපේක්ෂාවන් වෙනුවෙන් සුදුසුකම් ලැබීමේ විභාග හා වෘත්තීමය සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.

(උ) ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය, පුහුණුව හා පිළිගැනීම යන කරුණුවලදි සම තත්වයක් සහ අන්‍යෝන්‍යතාවයක් ස්ථාපිත කිරීම සඳහා විදේශීය රටවල බලධරයන් සමඟ අන්‍යෝන්‍ය වැඩ පිළිවෙළවල් සඳහා එකඟතාවය ඇති කර ක්‍රියාත්මක කිරීම.

(ඌ) නියම කරන ලද අධ්‍යාපන ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ ඉඩම් මැනුම් කටයුතු හා ඉඩම් තොරතුරු අධ්‍යාපන හා පුහුණු කටයුතු පිළිබඳව නියැලී සිටින ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

(එ) ශ්‍රී ලංකාවේ වෙනත් අදාළ වෘත්තීමය ආයතන හා සම්බන්ධ වෙමින් උසස් වෘත්තීය ප්‍රමිතීන් පවත්වාගෙන යාම.

## 05. ඉඩම් මැනුම් සභාව සතු බලතල

ඉඩම් මැනුම් සභාව වෙත පැවරෙන බලතල මැනුම් පනතේ 38 වැනි වගන්තිය යටතේ පහත පරිදි දක්වා ඇත.

( අ ) යම් චංචල හෝ නිශ්චල දේපළ අත්කරගැනීම, දැරීම, බද්දට හෝ බද්දට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.

( ආ ) මුදලින් හෝ අන්‍යාකාරයේ වූ ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග බාර ගැනීම සහ ස්වකීය කර්තව්‍යය ඉටු කිරීම සඳහා ඒවා යොදාගැනීම .

( ඇ ) සභාවේ කටයුතු කරගෙන යැම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් පත් කිරීම.

( ඈ ) එසේ පත්කරන ලද නිලධරයන්ට සහ සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික තීරණය කිරීම.

( ඉ ) ස්වකීය කර්තව්‍යයන් ඵලදායී ලෙස ඉටුකිරීම සඳහා කමිටු පත් කිරීම.

( ඊ ) ස්වකීය නිලධරයන් හා සේවකයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ සුභ සාධන හා ක්‍රීඩා පහසුකම් සැපයීම.

( උ ) සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීම.

( ඌ ) සාමාන්‍යයෙන් සභාවේ කර්තව්‍යය නිසි පරිදි ඉටු කිරීම පහසු කරලීම සඳහා අවශ්‍යවන අනෙකුත් සියලු දේ කිරීම.

## 06. 2019 වර්ෂය තුලදී ඉඩම් මැනුම් සභාවේ කාර්ය සාධනය

### 1. 2019 ජනවාරි මස 1 සිට දෙසැම්බර් මස 31 දක්වා කාලය තුල ඉඩම් මැනුම් සභාවේ සමාජිකයන්

සමාලෝචිත වර්ෂය තුළ, එනම්, 2019 ජනවාරි මස 1සිට දෙසැම්බර් මස 31දක්වා කාලය තුළ ඉඩම් මැනුම් සභාවේ පහත නම් සඳහන් අය සාමාජිකයින් ලෙස කටයුතු කරන ලදී.

| අනු අංකය | නම | තනතුර | කාල සීමාව |
|---|---|---|---|
| 1 | පී.එම්.පී උදයකාන්ත මහතා | සභාපති | 2019.01.01 සිට 2019.03.25 දක්වා |
| 2 | එස්.එම්.පි.පී. සංගක්කාර මහතා | සභාපති | 2019.03.26 සිට 2019.12.31 දක්වා |
| 3 | එස්. ඩී. පී.ජේ.දාම්පේගම මහතා | උපසභාපති | 2019.03.26 සිට 2019.12.31 දක්වා |
| 4 | ඩබ්ලිව්.එම්.එස්.වීරසිංහමහතා | සාමාජික | 2019.01.01 සිට 2019.05.31 දක්වා |
| 5 | ආරියරත්න දිසානායක මහතා | සාමාජික | 2019.06.01 සිට 2019.12.31 දක්වා |
| 6 | එන්. ජී. ගුණවර්ධන මහතා, | සාමාජික | 2019.01.01 සිට 2019.12.31 දක්වා |
| 7 | ජේ.එම්. විජේවර්ධන මහතා | සාමාජික | 2019.01.01 සිට 2019.12.31 දක්වා |
| 8 | කේ.ඒ.කේ.එල්. එදිරිසිංහ මහතා | සාමාජික | 2019.01.01 සිට 2019.12.31 දක්වා |
| 9 | ආචාර්ය එන්. කේ. වික්‍රමආරච්චි මයා | සාමාජික | 2019.01.01 සිට 2019.12.31 දක්වා |

## 2. 2019 දෙසැම්බර් මස 31 දිනට සභාවේ සිටි සමාජිකයන්ගේ මුළු සේවා කාලය

2019 දෙසැම්බර් මස 31 දිනට සිටි සභාවේ සාමාජිකයින් සේවය කරන ලද මුළු සේවා කාල පරිච්ඡේදයන් පහත දක්වා ඇත.

| අනු අංකය | නම | තනතුර | කාල සීමාව |
|---|---|---|---|
| 1 | පී.එම්.පී උදයකාන්ත මහතා | සභාපති | 2014.05.30සිට (අවු. 05 මාස 09දින25) |
| 2 | එස්.එම්.පි.පී. සංගක්කාර මහතා | උපසභාපති | 2014.05.29 සිට (අවු. 05 මාස 07 දින 02) |
| 3 | එස්. ඩී. පී.ජේ.දාම්පේගම මහතා | උපසභාපති | 2019.03.26 සිට (අවු. 00 මාස 09දින 05) |
| 4 | ඩබ්ලිව්.එම්.එස්.වීරසිංහමහතා | සාමාජික | 2017.02.07 සිට (අවු. 01 මාස 00 දින 11) |
| 5 | ආරියරත්න දිසානායක මහතා | සාමාජික | 2019.06.01සිට (අවු.00 මාස07දින00) |
| 6 | එන්. ඒ. ගුණවර්ධන මහතා, | සාමාජික | 2018.01.01 සිට (අවු. 02 මාස 00 දින 00) |
| 7 | ජේ.එම්. විජේවර්ධන මහතා | සාමාජික | 2018.01.01 සිට (අවු. 02 මාස 00 දින 00) |
| 8 | කේ.ඒ.කේ.එල්. එදිරිසිංහ මහතා | සාමාජික | 2018.01.01 සිට (අවු. 02 මාස 00 දින 00) |
| 9 | ආචාර්ය එන්. කේ. වික්‍රමආරච්චි මයා | සාමාජික | 2018.01.01සිට (අවු. 02 මාස 00 දින 00) |

## 3. සභාවේ රැස්වීම් සඳහා සමාජිකයන්ගේ සහභාගි වීම්

2019 වර්ෂය තුලදී එක් එක් සාමාජිකයින් සභා රැස්වීම් වලට සහභාගි වී ඇති වාර ගණන පහත දක්වා ඇත.

| අනු අංකය | නම | තනතුර | රැස්වීම් ගණන |
|---|---|---|---|
| 1 | පී.එම්.පී උදයකාන්ත මහතා | සභාපති | 03 |
| 2 | එස්.එම්.පි.පී. සංගක්කාර මහතා | සභාපති | 15 |
| 3 | එස්.එම්.පි.පී. සංගක්කාර මහත | උප සභාපති | 03 |
| 4 | එස්. ඩී. පී.ජේ.දාම්පේගම මහතා | උපසභාපති | 10 |
| 5 | ඩබ්ලිව්.එම්.එස්.වීරසිංහමහතා | සාමාජික | 06 |
| 6 | ආරියරත්න දිසානායක මහතා | සාමාජික | 10 |
| 7 | එන්. ඒ. ගුණවර්ධන මහතා, | සාමාජික | 19 |
| 8 | ජේ.එම්. විජේවර්ධන මහතා | සාමාජික | 18 |
| 9 | කේ.ඒ.කේ.එල්. එදිරිසිංහ මහතා | සාමාජික | 17 |
| 10 | ආචාර්ය එන්. කේ. වික්‍රමආරච්චි මයා | සාමාජික | 04 |

## 07. ඉඩම් මැනුම් සභාවේ කාර්යාලීය කාර්යය මණ්ඩලය

මැනුම් පනතේ 55 වැනි වගන්තිය මගින් සභාවේ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍යයයි සභාව සලකනු ලබන නිලධාරීන් හා සේවකයන් පත් කර ගැනීමට මැනුම් සභාවට බලය පැවරී ඇත. ඒ අනුව, පහත නම් සඳහන් කාර්ය මණ්ඩලය සමාලෝචිත කාල සීමාව තුළ මැනුම් සභාවේ කාර්යාලීය කාර්ය මණ්ඩලය ලෙස කටයුතු කර ඇත.

| අනු අංකය | නම | තනතුර | කාල සීමාව |
|---|---|---|---|
| 1 | පී. ඩී. අනුරසිරි මයා | වැඩ බලන ලේකම් | 2018-01-01<br>සිට 2019-12-31දක්වා |
| 2 | එච්. එම්.සාලිය ධර්මවර්ධන මයා | මුදල්අමාත්‍යාංශය නියෝජිත | -2018.06.01<br>සිට 2019.12.31 දක්වා |
| 3 | ටී. ඩී. දේවපුර මිය | ගණකාධිකාරී (අර්ධකාලීන) | 2018.06.01<br>සිට 2019.10.20 දක්වා |
| 4 | ඩබ්. එම්.එස්. පෙරේරා මිය | ගණකාධිකාරී (අර්ධකාලීන) | 2019.10.21<br>සිට 2019-12-31 දක්වා |
| 5 | ඩබ්ලිව්.ඒ.එස්.ප්‍රියදර්ශනී මිය | පරිගණක වැඩසටහන් සහකාර / ලිපිකරු-1 | 2004-05-24<br>සිට 2019-12-31 දක්වා |
| 6 | ආර්.එම්.එන්.රත්නායක මිය | පරිගණක වැඩසටහන් සහකාර / ලිපිකරු-2 | 2013-03-18<br>සිට 2019-12-31 දක්වා |
| 7 | ටී.ජී.ප්‍රනාන්දු මයා | කාර්යාල කාර්ය සහායක | 2004-7-15<br>සිට 2019-12-31 දක්වා |

## 08. ඉඩම් මැනුම් සභාවේ ක්‍රියාකාරකම්

### 1. ලියාපදිංචි කිරීම


සමාලෝචිත වර්ෂය සඳහා, එනම්, 2019 ජනවාරි 1 දින සිට දෙසැම්බර් 31 දින දක්වා කාලය සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරු ලෙස ලියාපදිංචි කිරීම සඳහා මිනින්දෝරුවරුන්ගෙන් ලද පරීක්ෂා කිරීමෙන් අනතුරුව, ඒ එක් එක් මිනින්දෝරුවරුන්ට ඉඩම් මැනීමේ කටයුතු කරගෙන යාම සඳහා නියමිත සුදුසුකම්, පළපුරුද්ද, හැකියාව සහ නිපුණතාවය ඇති බවට පරීක්ෂා කර බලන ලදී.

ඒ අතුරින් සභාව සෑහීමකට පත්වීමෙන් පසුව සමාලෝචිත වර්ෂය තුළ දී බලයලත් මිනින්දෝරු 97 ක් ඉඩම් මැනුම් සභාව විසින් අලුතින් ලියාපදිංචි කරන ලදී. ඒ අනුව 2019 දෙසැම්බර් 31 දිනට සභාවේ ලියාපදිංචිය ලබා ගත් මුළු මිනින්දෝරු සංඛ්‍යාව 2260 කි.

## 2. වෘත්තියේ යෙදීම සඳහා වාර්ෂික බලපත්‍ර

සමාලෝචිත වර්ෂය සඳහා මැනුම් වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර බාර ගැනීම 2019 සැප්තැම්බර් මාසයේදී අරඹන ලදී. අනතුරුව, ඒ සඳහා එම මිනින්දෝරුවරුන්ට දැනුම හා දක්ෂතාවය ඇති බවට සභාව පරීක්ෂා කර බැලීමෙන් පසුව 2019 වර්ෂය තුළදී ඉඩම් මැනුම් සභාව විසින් අලුතින් වාර්ෂික බලපත් 1052 ක් නිකුත් කරන ලදී. මෙය, 2018 වසර තුළ නිකුත් කරන ලද වාර්ෂික බලපත්‍ර සංඛ්‍යාව වන 957සමඟ සැසඳීමේදී 9.9% ක වැඩි වීමක් බව නිරීක්ෂණය වේ.

2018 සහ 2019 වසර තුළදී, ඉඩම් මැනුම් සභාව විසින් මිනින්දෝරුවරුන් වෙත නිකුත් කරන ලද වාර්ෂික මැනුම් බලපත්‍ර පිළිබඳ සංඛ්‍යාමය තොරතුරු පහත දැක්වෙන 1 වන රූපය මගින් ප්‍රස්තාරිකව නිරූපනය කර ඇත.




**1 වන රූපය**

2019 ජනවාරි 1 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වූ සමාලෝචිත වර්ෂය සඳහා 2019 පෙබරවාරි මස 28 දිනට වාර්ෂික මැනුම් බලපත්‍ර ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ මූලික තොරතුරු එනම්, මුලකුරු සමඟ නම, ලියාපදිංචි අංකය හා ජාතික හැඳුනුම්පත් අංකය යන තොරතුරු 2019 මාර්තු මස 29 වන දිනැති අංක 2117 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර පළ කිරීමට සභාව කටයුතු කරන ලදී.

එයට අමතරව, වාර්ෂික බලපත්‍ර ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ අදාළ සියලු තොරතුරු එනම්, ලියාපදිංචි අංකය, මුලකුරු සමඟ නම, සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, පදිංචි දිස්ත්‍රික්කය, ලිපිනය, දුරකථන අංක, වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර අංකය හා බලපත්‍රය වලංගු කාලසීමාව ආදී තොරතුරු ඉඩම් මැනුම් සභාවේ නිල වෙබ් අඩවියට www.landsurveycouncil.org ඇතුළත් කර ඇත. මෙම විස්තර ත්‍රෛමාසිකව යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ඇත.

## 3. මහජනතාව වෙත තොරතුරු ලබා දීම.

ඉඩම් මැනුම් සභාව විසින් ලබාදෙන සේවාවන් පිළිබඳව මහජනතාව මේ වන විට මනාව දැනුවත් වී ඇත. එබැවින්, වසර සිය ගණනක් පැරණි පිඹුරු සම්බන්ධයෙන් වුව ද, ඊට අදාළ මැනුම් කටයුතු කර ඇති බලයලත් මිනින්දෝරුවරුන්ගේ ජීව දත්ත තොරතුරු ලබා ගැනීම සඳහා ඉඩම් මැනුම් සභාව වෙත පැමිණෙන පිරිස් පසු ගිය කාලය තුළ සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. ඊට අමතරව, විද්‍යුත් තැපැල මගින් ද එම තොරතුරු සඳහා නිරතුරුවම ඉල්ලීම් ලැබේ. එම තොරතුරු නිවැරදිව හා ඉක්මනින් ලබා දීමට මැනුම් සභා කාර්ය මණ්ඩලය ඉමහත් කැපවීමකින් කටයුතු කරන අතර, එහිදී එම තොරතුරු එසැනින් ලබා දීමට, හැකි සෑම විටම කටයුතු කරනු ලැබේ. සමාලෝචිත කාල සීමාව තුළ මහජනතාවගේ ඉල්ලීම් අනුව අවස්ථා 168 ක දී තොරතුරු ලබා දී ඇත.

වාර්ෂික බලපත්‍රලාභී සියලුම ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ පෞද්ගලික ලිපිනය, ලියාපදිංචි අංකය, දුරකථන අංකය, වාර්ෂික බලපත්‍ර අංක ආදී තොරතුරු ඇතුළත් පරිගණක ගත දත්ත පද්ධතියක් මැනුම් සභාව විසින් සකස් කර පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. ඊට අමතරව, ඔවුන්ගේ ඡායා රූපයක්ද එම දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට ඉදිරියේ දී කටයුතු කර ඇත. මෙම දත්ත පද්ධතියට ඔවුන්ගේ දුරකථන අංක ඇතුළු සම්බන්ධතා තොරතුරු ඇතුළත් කර ඇති නිසා අවශ්‍ය පිඹුරු වල පිටපත් ලබා ගැනීමට ඔවුන් කෙලින්ම සම්බන්ධ කර ගැනීමේ පහසුකම මෙමගින් මහජනතාවට ලැබී ඇත. එතකුදු වුව ද, මේ දක්වා මැනුම් සභාව විසින් ලබා දෙන මෙම සේවාව හරහා මහජනතාවට අවශ්‍ය බලයලත් මිනින්දෝරුවරුන් විසින් පිළියෙල කළ පැරණි පිඹුරු වල පිටපත් ලබා ගැනීමේ ක්‍රම වේදයක් සකස් කිරීමට නොහැකි වී ඇත. මැනුම් කටයුතු සම්බන්ධයෙන් මහජනතාව මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් ලෙස මෙය හඳුනා ගෙන ඇති අතර ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ හැකි ක්‍රමවේදයක් සැලසුම් කිරීමට සභාවේ අවධානය මේ වන විට යොමු වී ඇත.

## 4. ඉඩම් මැනුම් සභාව වෙත ලද මහජන පැමිණිලි

බලයලත් මිනින්දෝරුවරුන් විසින් කරනු ලබන වෘත්තීමය විෂමාචාර වලට සම්බන්ධව මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි විභාග කිරීම ඉඩම් මැනුම් සභාව සතු තවත් එක් ප්‍රධාන කර්තවයකි. හුදෙක්, මෙම පැමිණිලි විභාග කෙරෙනුයේ මැනුම් පනතේ 46 වැනි වගන්තිය යටතේ සලසා ඇති විධි විධාන වලට යටත්ව වේ. පැමිණිලි විභාග කිරීම සඳහා සැම මසකට වරක් ඉඩම් මැනුම් සභාව රැස්වෙන අතර එක සභා වාරයකදී පැමිණිලි 6 ක් හෝ 7 ක් විභාග කිරීමට කටයුතු කරයි. මෙමගින්, මහජනතාවට ඉඩම් ගැටළු සම්බන්ධයෙන් පවතින ගැටළු බොහෝ දුරට නිරාකරණය කර ගැනීමට හැකි වන අතර මිනින්දෝරුවරුන් අතර විනය පවත්වා ගෙන යාමට ක්‍රියාමාර්ගයක් ද සැලසෙනු ඇත.


කෙසේ වුවද, සමහර පැමිණිලිවල ස්වභාවය අනුව එනම්, අධිකරණ ක්‍රියාමාර්ගවලට යටත්, චෝදනා ඔප්පු කිරීමට තරම් වූ සාක්ෂි නොමැති, අධිකරණ නියෝග අනුව උසාවි කොමසාරිස්වරුන් ලෙස කරන ලද මැනුම් සහ ඉඩම් මැනුම් සභාවේ බලතල යටතේ ක්‍රියාකළ නොහැකි ගණයේ පැමිණිලි සම්බන්ධව ඉඩම් මැනුම් සභාව තීරණ ලබා නොදෙන අතර, එවැනි අවස්ථාවලදී අදාළ පැමිණිලිකරුවන්ට එම ගැටළු අධිකරණ ක්‍රියා මාර්ගයෙන් විසඳා ගැනීමට අවශ්‍ය උපදෙස් දෙනු ලැබේ.

2018 වසරේ ලැබී විභාග කර අවසන් නොවූ පැමිණිලි හා 2019 වසරේ තුළ විභාග කළ පැමිණිලි පිළිබඳ සංඛ්‍යා තොරතුරු මෙහි පහතින් දැක්වේ.

| | |
|---|---|
| 2018 ජනවාරි මස 1 දිනට විභාග අවසන් නොවී ඉතිරිව තිබූ සංඛ්‍යාව | = 31 |
| 2019 වසර තුළදී ලද මුළු පැමිණිලි සංඛ්‍යාව | = 73 |
| 2019 වසර තුළදී විභාග අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | = 54 |
| 2019 දෙසැම්බර් 31 දිනට විභාග අවසන් නොවී ඉතිරි වූ සංඛ්‍යාව | = 50 |

2018 වසර තුළදී ලද පැමිණිලි සංඛ්‍යාව 49 වූ අතර එයට සාපේක්ෂව 2019 වසර තුළ පැමිණිලි ලැබීමේ ප්‍රතිශතය 48% කින් වැඩි වී ඇති බව නිරීක්ෂණය වේ. එසේම, පැමිණිලි විභාග අවසන් කිරීම 2018 වසරේදී 45 ක් වූ අතර එයට සාපේක්ෂව 2019 වසරේ පැමිණිලි විභාග කිරීමේ ප්‍රතිශතය 20% කින් වැඩි වී ඇති බව නිරීක්ෂණය වේ.

මෙම දත්ත පහත දැක්වෙන 2 වන රූපය මගින් ප්‍රස්ථාරිකව නිරූපණය කර ඇත.




**2 වන රූපය**

## 5. ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් ගේ විෂමාචාර ක්‍රියා සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග

මැනුම් කටයුතු කිරීමේදී විෂමාචාර ක්‍රියාවන් කර ඇති බවට සභාව නිගමනය කර ඇති විටෙක එවැනි අයට එරෙහිව 2002 අංක 17 දරණ මැනුම් පනතේ 47 වැනි වගන්තිය යටතේ සලසා ඇති විධි විධාන අනුව දඬුවම් පමුණුවා ලිය හැක.

2018 වසරේ දී ඉඩම් මැනුම් සභාව විසින් ඉහත 4 වැනි ඡේදයෙහි විස්තර කර ඇති පරිදි, ලැබෙන පැමිණිලි විභාග පවත්වනු ලැබීමෙන් පසුව ගන්නා ලද තීරණ අනුව වග උත්තරකාර මිනින්දෝරුවරුන්ට පහත සඳහන් පරිදි දඬුවම් පමුණුවන ලදී.

| | |
|---|---|
| ලියාපදිංචිය අවලංගු කළ සංඛ්‍යාව | = 00 |
| ලියාපදිංචිය තාවකාලිකව අත්හිට වූ සංඛ්‍යාව | = 01 |
| වාර්ෂික බලපත්‍රය අවලංගු කළ සංඛ්‍යාව | = 03 |
| වාර්ෂික බලපත්‍රය තාවකාලිකව අත්හිට වූ සංඛ්‍යාව | = 01 |

2019 වසර තුළදී විභාග කොට අවසන් කරන ලද පැමිණිලි අතුරින්, එලෙස දඬුවම් පමුණුවන ලද මිනින්දෝරුවරුන් පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

| පැමිණිලි අංක | ලියාපදිංචි අංක | මිනින්දෝරුවරයාගේ නම | ගන්නා ලද ක්‍රියාමාර්ගය |
|---|---|---|---|
| LSC/5/1029 | 19880833 | ජේ පී.එන්. ජයසුන්දර. | 2019.03.25 සිට2019.06.26 දක්වා බලපත්‍රය අත්හිටුවන ලදී. |
| LSC/5/1029 | 19960925 | ඒ.ඩී.සී. කුලතුංග | ------- එම ---------- |
| LSC/5/1068 | 19900996 | පී. අයි. මල්ලිකා | 2019.10.04 සිට 2020.12.31 දක්වා ලියාපදිංචිය අත්හිටුවන ලදී. |
| LSC/5/1077 | 19821432 | ඒ. කන්දසාමි | 2020 වසරට අදාළව බලපත්‍රය අත්හිටුවන ලදී. |

## 09. අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්

### 1. අඛණ්ඩ වෘත්තීය සංවර්ධන ( CDP) පාඨමාලා

බිම් මැනීම හා සම්බන්ධ විෂයයන් ගත් කළ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය අත්‍යවශ්‍ය අංගයක් වේ. මැනුම් වෘත්තියේ යෙදී සිටින සහ මැනුම් සභාවේ වාර්ෂික බලපත්‍රය ලබා ගැනීමට අපේක්ෂා කරන වෘත්තිකයන්ගේ දැනුම සහ දක්ෂතා වැඩිදියුණු කරලීම සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඉඩම් මැනුම් සභාව සතු කාර්යයක් බවට මැනුම් පනතේ 37 වැනි වගන්තිය යටතේ විධි විධාන සලස්වා ඇත. එබැවින් සියලුම ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් මැනුම් වෘත්තිය හා සම්බන්ධව නූතන තාක්ෂණය හා ක්‍රමවේද පිළිබඳව වූ පුහුණු පාඨමාලා / වැඩමුළු වලට සහභාගි කරවීම සඳහා උනන්දු කරවීම ඉඩම් මැනුම් සභාව විසින් සිදු කරනු ලබයි.

මෙහිදී, පුද්ගලික මැනුම් වෘත්තියෙහි නියැලීමට අපේක්ෂා කරන ආධුනික මැනුම් වෘත්තිකයන් දිශානුගත කිරීමේ වැඩසටහන් මෙන්ම පළපුරුදු මිනින්දෝරුවරුන් සඳහා දියුණු තාක්ෂණික ක්‍රම වලට අදාළ වැඩසටහන් ද වෙන් වශයෙන් පවත්වනු ලැබේ. තවද, ඉඩම් මැනුම් සභාවට අමතරව, එහි නියාමනය යටතේ ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනයසහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරුවරුන්ගේ සංගම් වැනි පිළිගත් ආයතන මගින්ද මෙම වැඩසටහන් ක්‍රියාත්මක වේ.

### 2. ප්‍රථම වරට වෘත්තියේ යෙදීමේ බලපත්‍ර ලබාගන්නා මිනින්දෝරුවරුන් සඳහා වැඩමුළු

ඉඩම් මැනුම් සභාව විසින් වෘත්තියේ යෙදීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන් වෙත ලබා දෙන වාර්ෂික මැනුම් බලපත්‍රය යොදා ගනිමින් වෘත්තීය මිනින්දෝරුවරුන් ලෙස තම ජීවන වෘත්තියට ප්‍රථම වරට පිවිසෙන අවස්ථාවේදී ඔවුන් සඳහා දිශානුගත කිරීමේ

පාඨමාලා පැවැත්වීම ඉඩම් මැනුම් සභාව විසින් වාර්ෂිකව සිදු කරයි. එම පාඨමාලාවලදී සම්පත් දායකත්වය සඳහා තාක්ෂණික දැනුමක් හා පළපුරුද්දක් සහිත කීර්තිමත් ලියාපදිංචි මිනින්දෝරුවරුන් යොදා ගනිමින් නවක මිනින්දෝරුවන් හට අවශ්‍ය දැනුම සහ අවබෝධය ලබා දීම සිදු කෙරෙනු ඇත.

## 3. බාහිර ආයතන විසින් පවත්වනු ලැබූ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා

ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය සහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගම් මගින් ලියාපදිංචි මිනින්දෝරුවරුන් සහ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා පැවැත්වීමෙහි ලා විශේෂ උනන්දුවකින් කටයුතු කරයි. එම පාඨමාලා ඉඩම් මැනුම් සභාවේ නියාමනය යටතේ පවත්වනු ලබන අතර ඒ සම්බන්ධයෙන් ඉහත සඳහන් කළ බාහිර ආයතන දක්වනු ලබන උනන්දුව පිළිබඳ ඉඩම් මැනුම් සභාව අතිශයින් සතුටට පත් වේ.

2019 වසරේදී පවත්වා ඇති අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.


| අනු අංකය | ආයතනය | වෘත්තීය සංවර්ධන පාඨමාලාව | පැවැත්වූ දිනය |
|---|---|---|---|
| 1. | ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය | CORS Network,CORS Compatible Survey equipment | 26-01-19 |
| 2. | මහනුවර දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගමය | Modern Survey Application Techniques | 25-02-19 |
| 3. | මහනුවර දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගමය | Condominium Surveys | 27-09-19 |
| 4. | ඉඩම් මැනුම් සභාව | Orientation Programme | 23-03-19 |
| 5. | ගම්පහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගමය | Condominium Surveying related with Bimsaviya | 05-04-19 |
| 6. | ශ්‍රී ලංකාමිනින්දෝරු ආයතනය | Court Commission Surveys | 26-05-19 |
| 7. | ඉඩම් මැනුම් සභාව | Digital Elevation Model,DB Management System<br>Batch 1<br>Batch 2 | <br><br>22-06-19<br>09-09-19 |
| 8. | ශ්‍රී ලංකාමිනින්දෝරු ආයතනය | Professionalism, Ethics | 03-09-19 |
| 9. | ඉඩම් මැනුම් සභාව | Modern Surveying System | 07-09-19 |
| 10. | ගම්පහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගමය | CAD Secrets and Statutory Laws Governing Surveying | 01-10-19 |
| 11. | මහනුවර දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගමය | UDA & MBRO Regulation and Preparation of Digital Topographic Drawings | 26-01-19 |

## 10. මූල්‍ය කළමනාකරණය

### 1). මුළු ආදායම සහ මුළු වියදම

2019 වසර තුළදී ඉඩම් මැනුම් සභාව රැස් කරන ලද මුළු ආදායම රු.5,671,181.19ක් වූ අතර එම වසර තුළදී දරණ ලද මුළු වියදම 4,482,302.69 විය. ඒ අනුව 2018 වසර සමග සැසඳීමේදී, 2019 වසර තුළදී සභාව රැස් කරන ලද ආදායම 1,159,705.65 කින් වැඩිවී ඇති අතර වියදම රු. 780,156.22 කින් අඩු වී ඇත.

පහත දැක්වෙන 3 වැනි රූපයේ 2018සහ 2019 වසර වල මුළු ආදායම සහ වියදම ප්‍රස්ථාරිකව නිරූපණය කර ඇත.




3 වැනි රූපය

### 2). සභාවේ අරමුදල් සහ මූල්‍ය කළමනාකරණය

මැනුම් පනතේ 56 (2) වැනි වගන්තිය යටතේ ඉඩම් මැනුම් සභාවේ අරමුදල් රැස් කළ යුතු ආකාරය විස්තර කර ඇත. ඒ අනුව, ඒකාබද්ධ අරමුදලින් ලැබිය හැකි මුදල් ද, මැනුම් පනත යටතේ සභාවට දී ඇති බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙන් සහ ඉටු කිරීමෙන් සභාවට ලැබෙන මුදල් ද සභාවට බැර කළ යුතු වේ. එයට අමතරව ත්‍යාග, ප්‍රධාන සහ පරිත්‍යාග වශයෙන් සභාවට ලැබෙන මුදල් ද සභාවේ අරමුදලට එකතු වේ. සභාවේ කාර්යයන් සහ බලතල ක්‍රියාත්මක කිරීමේදී වැය වන මුදල් මැනුම් පනතේ 56(3) වගන්තිය යටතේ සලසා ඇති විධි විධාන අනුව මෙම අරමුදලින් ගෙවිය යුතු වේ.

ඉඩම් මැනුම් සභාවට මහා භාණ්ඩාගාරයෙන් පෙර වසර දෙකකදී පමණක් මූල්‍ය ප්‍රතිපාදන ලැබී ඇත. එහෙත්, 2019 වසරේදී කිසිදු ප්‍රතිපාදන මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ලැබී නැත. එබැවින් මැනුම් සභාවේ බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු

කිරීමේදී ඊට අදාළ සියලු ආයතනික සහ පරිපාලන වියදම් දරණු ලද්දේ එමගින් රැස් කර ගන්නා අරමුදල් මගිනි. මැනුම් සභාවේ සියලු මුදල් මැනුම් සභාව විසින් කළමනාකරණය කරනු ලැබේ.

මැනුම් සභාවේ ප්‍රධාන අරමුදල් ප්‍රභවය වන්නේ මිනින්දෝරු වෘත්තිකයන්ට වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමෙන් ලැබෙන ආදායම වේ. එයට අමතරව, පුහුණු වැඩසටහන් සහ වැඩමුළු පැවැත්වීමෙන්, මහජනතාවට තොරතුරු නිකුත් කිරීමෙන්, මහජන පැමිණිලි ඇතුළත් කිරීමෙන් සහ පරීක්ෂණ ගාස්තු ලෙස වූදිත මිනින්දෝරුවරුන්ගෙන් අයකරන පරීක්ෂණ ගාස්තු ආදියෙන්ද මැනුම් සභාවට අරමුදල් එක් රැස් වේ.

2019 වසරේ දෙසැම්බර් මස 31 වන දිනට මැනුම් සභාවේ ස්ථාවර තැන්පතු ගිණුමේ තිබූ අරමුදල් ශේෂය රුපියල් 9,362,816.48 ක් විය.

## 3). මූල්‍ය කටයුතු විගණනය

මැනුම් සභාව විසින් කරනු ලබන මූල්‍ය කටයුතු විගණකාධිපති විසින් වාර්ෂික විගණනයට භාජනය කරනු ලැබේ. විගණන කළමනාකරණ කමිටුවක්ද මැනුම් සභාව විසින් පත් කර ඇති අතර එය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

i). මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු (සභාපති)
ii). මැනුම් සභාවේ ලේකම් (ලේකම්)
iii). විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු (නිරීක්ෂක)
iv). මැනුම් සභාවේ සාමාජිකයකු (සාමාජික)
v). මැනුම් සභාවේ ගණකාධිකාරී (සාමාජික)

ත්‍රෛමාසිකව මෙම කමිටුව රැස් වන අතර එහිදී, සභාවේ කටයුතු විශ්ලේෂණාත්මකව විමසා බලනු ලැබීමෙන් පසු එකී කමිටු වාර්තා මැනුම් සභාවේ අවධානයට සහ අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා යොමු කෙරේ. 2019 වසර සඳහා නිකුත් කරන ලද විගණකාධිපතිගේ විගණන වාර්තාව මෙහි අඩංගු කොට ඇත.

එච්.එම්.බී.පී. හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

එච්.එම්.බී.පී. හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර"
ඉඩම් නිරවුල්කිරීම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

එස් සිවානන්දරාජා
සභාපති
ඉඩම් මැනුම් සභාව

Chairman
Land Survey Council

## 11. 2019 වර්ෂය සඳහා අවසාන ගිණුම් ප්‍රකාශන (ඇමුණුම්)

# ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
# ඉඩම් මැනුම් සභාව
# 2019 දෙසැම්බර් 31 වන දිනට
# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

රු.

| | සටහන් | 2019 | 2018 |
|---|---|---|---|
| ***වත්කම්*** | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ පිරියත හා උපකරණ | 1 | 75,870,204.96 | 765,643.44 |
| | | 75,870,204.96 | 765,643.44 |
| ***ජංගම වත්කම්*** | | | |
| ආපදා ණය | 2 | 570,401.00 | 390,335.00 |
| ස්ථාවර තැන්පතු | 3 | 9,362,816.48 | 6,516,499.77 |
| ලැබිය යුතු දෑ | 4 | 328,539.90 | 313,877.06 |
| මුදල් හා මුදල් සමාන දෑ | 5 | 1,983,091.25 | 2,160,888.26 |
| | | 12,244,848.63 | 9,381,600.09 |
| ***මුළු වත්කම්*** | | 88,115,053.59 | 10,147,243.53 |
| ***හිමිකම් හා වගකීම්*** | | | |
| ප්‍රාග්ධන දායකත්වය දරනුයේ: | | | |
| මහා භාණ්ඩාගාරය | | 1,043,030.00 | 1,043,030.00 |
| ප්‍රත්‍යාගණනා සංචිතය | | 75,100,000.00 | - |
| සමුච්චිත අරමුදල | | 3,785,545.35 | 7,588,107.47 |
| අතිරික්තය/ (ඌනතාවය) | | 1,188,878.50 | (751,184.37) |
| ***මුළු හිමිකම්*** | | 81,117,453.85 | 7,879,953.10 |
| ***ජංගම නොවන වගකීම්*** | | | |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 6 | 549,479.00 | 500,172.00 |
| ***ජංගම වගකීම්*** | | | |
| උපචිත වියදම් | 7 | 699,600.74 | 462,468.43 |
| පූර්ව ලැබීම් | | - | 1,304,650.00 |
| පූර්ව ගෙවීම් | 8 | 5,748,520.00 | - |
| | | 6,448,120.74 | 1,767,118.43 |
| ***මුළු වගකීම්*** | | 6,997,599.74 | 2,267,290.43 |
| ***මුළු හිමිකම් හා වගකීම්*** | | 88,115,053.59 | 10,147,243.53 |

ඉඩම් මැනුම් සභාව වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා සභාවේ සාමාජිකයන් වගකියනු ලැබේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන් හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත.

| | | |
|---|---|---|
| එච්.එම්.බී.පී. හේරත් | එස් සිවානන්දරාජා | කේ එල් ජී එම් සඳමාලි |
| ලේකම් | සභාපති | ගණකාධිකාරී |
| සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය | ඉඩම් මැනුම් සභාව | ඉඩම් මැනුම් සභාව |

එච්.එම්.බී.පී. හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර"

Chairman
Land Survey Council

Accountant
Land Survey Council

# ඉඩම් හා ඉඩම් සංවර්ධනඅමාත්‍යාංශය

## ඉඩම් මැනුම් සභාව

## 2019 දෙසැම්බර් 31 වන දිනට

## මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

LKR.

| | සටහන් | 2019 | 2018 |
|---|---|---|---|
| *ආදායම්* | | | |
| බලපත්‍ර ගාස්තු | | | |
| ලියාපදිංචි කිරීමේ ගාස්තු | | 3,051,000.00 | 2,392,500.00 |
| ස්ථාවර තැන්පතු පොළිය | | 420,000.00 | 150,500.00 |
| වෙනත් ආදායම් | 9 | 467,707.27 | 575,309.28 |
| වැඩමුළුවලින් ලත් ශුද්ධ ආදායම | 10 | 317,310.92 | 222,276.96 |
| මුළු ආදායම | 11 | 1,415,163.00 | 1,170,889.30 |
| | | 5,671,181.19 | 4,511,475.54 |
| | | | |
| *අඩු කළා: වියදම්* | | | |
| පරිපාලන හා ආයතනික | | | |
| සේවක පාරිශ්‍රමික | 12 | 1,687,863.15 | 1,604,371.15 |
| අනෙකුත් දීමනා | 13 | 1,868,257.21 | 1,765,396.25 |
| ගමන් වියදම් | 14 | 26,851.00 | 13,905.00 |
| ලිපිද්‍රව්‍ය | | 114,237.53 | 160,154.30 |
| රැස්වීම් සඳහා සංග්‍රහ වියදම් | | 106,938.00 | 125,526.00 |
| පිරියත, යන්ත්‍රෝපකරණ හා උපකරණ නඩත්තුව | 15 | 51,073.65 | 94,674.34 |
| පිරියත යන්ත්‍රෝපකරණ හාඋපකරණ වැඩිදියුණු කිරීම | | - | 59,110.92 |
| ටෙලිකොම්/ තැපැල් හා සන්නිවේදන කටයුතු | | 140,753.18 | 181,556.00 |
| විදුලි වියදම් | | 74,534.40 | 74,534.40 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 49,307.00 | - |
| ජල බිල්පත් | | 4,200.00 | 4,200.00 |
| විගණන ගාස්තු | | 50,000.00 | 50,000.00 |
| අනෙකුත් වියදම් | 16 | 152,494.09 | 939,773.40 |
| | | 4,326,509.21 | 5,073,201.76 |
| *මූල්‍ය හා වෙනත් වියදම්* | | | |
| බැංකු ගාස්තු | | - | 750.00 |
| ක්ෂය කිරීම් | | 155,793.48 | 188,708.15 |
| | | 155,793.48 | 189,458.15 |
| | | | |
| මුළු වියදම් | | 4,482,302.69 | 5,262,659.91 |
| | | | |
| *අතිරික්තය/ (ඌනතාවය)* | | 1,188,878.50 | (751,184.37) |

# ඉඩම් හා ඉඩම් සංවර්ධනඅමාත්‍යාංශය

## ඉඩම් මැනුම් සභාව

## 2019 දෙසැම්බර් 31 වන දිනට

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

LKR.

| | 2019 | 2018 |
|---|---|---|
| මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය | | |
| අතිරික්තය/ (ඌනතාවය) | 1,188,878.50 | (751,184.37) |
| ගැලපුම් කළා | | |
| ක්ෂය කිරීම් | 155,793.48 | 188,708.15 |
| පාරිතෝෂිත | 49,307.00 | 43,221.00 |
| සමුච්චිත අරමුදල | (3,051,377.75) | |
| ස්ථාවර තැන්පතු පොළිය | (467,707.27) | (575,309.28) |
| කාරක ප්‍රාග්ධන වෙනස් වීම් වලට පෙර මෙහෙයුම් ලාභය | (2,125,106.04) | (1,094,564.50) |
| කාරක ප්‍රාග්ධන වෙනස් වීම් | | |
| ආපදා ණය (වැඩිවීම)/(අඩු වීම) | (180,066.00) | (69,670.00) |
| ලැබිය යුතු මුදල් (වැඩිවීම)/(අඩු වීම) | (14,662.84) | (30,000.00) |
| ගෙවිය යුතු මුදල් (වැඩිවීම)/(අඩු වීම) | 237,132.31 | 91,870.31 |
| පූර්ව ලැබීම් (වැඩිවීම) /( අඩුවීම) | (1,304,650.00) | 1,304,650.00 |
| පූර්ව ගෙවීම් (වැඩිවීම) /( අඩුවීම) | 5,748,520.00 | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 2,361,167.43 | 202,285.81 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | |
| ස්ථාවර තැන්පතු | (2,846,316.71) | (1,016,499.77) |
| ස්ථාවර වත්කම් මිලදී ගැනුම් | (160,355.00) | - |
| ලැබූ පොලී ආදායම | 467,707.27 | 1,262,880.14 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (2,538,964.44) | 246,380.37 |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | - | - |
| | | - |
| මුදල් හා මුදල් සමාන දෑහි ශුද්ධ වැඩිවීම/(අඩුවීම්) | (177,797.01) | 448,666.18 |
| කාල පරිච්ඡේදය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ | 2,160,888.26 | 1,712,222.08 |
| කාල පරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ | 1,983,091.25 | 2,160,888.26 |

# ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
## ඉඩම් මැනුම් සභාව
## හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය
## 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

LKR.

| විස්තරය | සටහන් | ප්‍රාග්ධන ප්‍රදාන | සමුච්චිත අතිරික්තය/(හිඟය | එකතුව | Total |
|---|---|---|---|---|---|
| **2019 ජනවාරි මස 01 දිනට ශේෂය** | | **1,043,030.00** | **-** | **6,836,923.10** | **7,879,953.10** |
| එකතුකළා | | | | | - |
| ඉඩම ප්‍රත්‍යාගණනය | | - | **75,100,000.00** | - | **75,100,000.00** |
| අඩුකළා | | | | | - |
| පූර්ව වර්ෂ ගැලපුම | **17** | | | **(3,051,377.75)** | **(3,051,377.75)** |
| එකතුකළා | | | | **3,785,545.35** | **79,928,575.35** |
| එකතුකළා /(අඩුකළා) | | | | | - |
| කාල සීමාව සඳහා අතිරික්තය /(ඌනතාවය) | | | | **1,188,878.50** | **1,188,878.50** |
| | | | | | - |
| **2019 දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | | **1,043,030.00** | **75,100,000.00** | **4,974,423.85** | **81,117,453.85** |

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**සටහන 1:** දේපළ, පිරියත හා උපකරණ

| අයිතමය | 2019.01.01 | වර්ෂය තුළ ප්‍රත්‍යාගණනය /මිලදී ගැනුම | එකතුව | ක්ෂය කිරීම % | වාර්ෂික ක්ෂය කිරීම | 2019.12.31 දිනට ශුද්ධ අගය |
|---|---|---|---|---|---|---|
| **අයිතමය** | | | | | | |
| ඉඩම් | - | 75,100,000.00 | 75,100,000.00 | - | - | 75,100,000.00 |
| යන්ත්‍රෝපකරණ | 119,794.49 | 160,355.00 | 280,149.49 | 20% | 30729.9 | 249,419.59 |
| ගෘහභාණ්ඩ | 121,218.94 | - | 121,218.94 | 10% | 12121.89 | 109,097.05 |
| පරිගණක සහ උපාංග | 204,150.83 | - | 204,150.83 | 25% | 51037.71 | 153,113.12 |
| කාර්යාලීය උපකරණ | 11,875.44 | - | 11,875.44 | 25% | 2968.86 | 8,906.58 |
| ඉඩම් මැනුම් සභාවේ නාම පුවරුව | 20,214.38 | - | 20,214.38 | 20% | 4042.88 | 16,171.50 |
| ගොඩනැගිලි හා ව්‍යුහ (වෙන් කිරීම්) | 260,532.99 | - | 260,532.99 | 20% | 52106.6 | 208,426.39 |
| **අස්පෘශ්‍ය වත්කම්** | | | | | | |
| ගිණුම්කරණ මෘදුකාංග | 27,856.37 | - | 27,856.37 | 10% | 2785.64 | 25,070.73 |
| **එකතුව** | 765,643.44 | 75,260,355.00 | 76,025,998.44 | | 155793.48 | 75,870,204.96 |

වර්ශය තුළදී අප විසින් පවතින ඉඩමේ අගය ප්‍රත්‍යාගණනය කරනු ලැබූ අතර එකී ප්‍රත්‍යාගණිත අගය මූල්‍ය ප්‍රකාශනවලදක්වා ඇති අතර ප්‍රත්‍යාගණන සංචිතය හඳුනාගන්නා ලදී.

**සටහන 3** ආපදා ණය

| | | |
|---|---|---|
| ඩබ්.ඒ.එස්.ප්‍රියදර්ශනී | 220,838.00 | |
| ආර්.එම්.එන්.රත්නායක | 220,838.00 | |
| ටී.ජී.ප්‍රනාන්දු | 128,725.00 | |
| | | 570,401.00 |

**සටහන 4** ස්ථාවර තැන්පතු

| ස්ථාවර තැන්පතු අංකය | ආරම්භ කළ දිනය | කාල සීමාව | වටිනාකම | | |
|---|---|---|---|---|---|
| 85143581 | 19.11.2019 | 6 Months | | 400,000.00 | |
| 85143616 | 19.11.2019 | 6 Months | | 400,000.00 | |
| 85144124 | 19.11.2019 | 6 Months | | 400,000.00 | |
| 85144265 | 19.11.2019 | 6 Months | | 400,000.00 | |
| 85144298 | 19.11.2019 | 6 Months | | 400,000.00 | |
| 85144323 | 19.11.2019 | 6 Months | | 400,000.00 | |
| 82652551 | 10.05.2018 | 1 Year | | 1,000,000.00 | |
| 82652606 | 10.05.2019 | 3 Months | | 345,253.40 | |
| 82652638 | 10.05.2020 | 1 Year | | 1,000,000.00 | |
| 82652648 | 10.05.2021 | 6 Months | | 1,158,781.54 | |
| 82652661 | 10.05.2022 | 6 Months | | 1,158,781.54 | |
| 83986770 | 05.03.2019 | 3 Months | | 500,000.00 | |
| 84315875 | 15.05.2019 | 6 Months | | 400,000.00 | |
| 84315923 | 15.05.2019 | 3 Months | | 300,000.00 | |
| 84315931 | 15.09.2019 | 3 Months | | 300,000.00 | |
| 85143810 | 19.11.2019 | 6 Months | | 400,000.00 | |
| 85144216 | 19.11.2019 | 6 Months | | 400,000.00 | |
| | | | | | 9,362,816.48 |

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| | | | | | |
|---|---|---|---|---|---|
| සටහනඅංක 04 | ලැබිය යුතු ආදායම | | | | |
| | ස්ථාවර තැන්පතු අංකය | | උප අගය | එකතුව | |
| ස්ථාවර තැන්පතු පොළිය | 82652638 | | 102,125.00 | | |
| | 82652551 | | 102,125.00 | | |
| | 84315875 | | 20,190.60 | | |
| | 84315923 | | 13,340.07 | | |
| | 84315931 | | 13,340.07 | | |
| | 85144432 | | 1,639.72 | | |
| | 85144357 | | 1,639.72 | | |
| | 85144467 | | 1,639.72 | | |
| | | | | 256,039.90 | |
| විමර්ශන සඳහා ලැබිය යුතු ගාස්තු | | | 72,500.00 | | |
| | | | | 72,500.00 | |
| | | | | | 328,539.90 |
| | | | | | |
| සටහනඅංක 05 | මුදල් සමාන දෑ | | | | |
| ස්ථාවර තැන්පතු අංකය | | | වටිනාකම | වටිනාකම | |
| 85144432 | | | 400,000.00 | | |
| 85144357 | | | 400,000.00 | | |
| 85144467 | | | 400,000.00 | | |
| | | | | 1,200,000.00 | |
| බැංකුවේ ඇති මුදල් | | | | 782,491.25 | |
| අතැති මුදල් | | | | 600.00 | |
| | | | | | 1,983,091.25 |
| | | | | | |
| සටහනඅංක 06 | පාරිතෝෂික ප්‍රතිපාදන | | | | |
| නම | | 31.12.2019 දිනට මූලික වැටුප | | 2019 වර්ෂයසඳහා පාරිතෝෂික | |
| 2018 වර්ෂය දක්වා | | | | 500,172.00 | |
| ඩබ්.ඒ.එස්.ප්‍රියදර්ශනී | | 15 | 40,562.00 | 20,281.00 | |
| ආර්.එම්.එන්.රත්නායක | | 6 | 26,363.00 | 13,181.50 | |
| ටී.ජී.ප්‍රනාන්දු | | 15 | 31,689.00 | 15,844.50 | |
| | | | | 49,307.00 | 549,479.00 |
| | | | | | |
| සටහනඅංක 07 | සමුච්චිත වියදම් | | | | |
| උපචිත විගණන ගාස්තු | | | | 452,229.00 | |
| උපචිත නඩත්තු වියදම් | | | | 7,919.99 | |
| උපචිත භාෂා පරිවර්තන ගාස්තු | | | | 9,565.50 | |
| උපචිත ගණකාධිකාරී දීමනාව | | | | 10,669.75 | |
| උපචිත තැපැල් හා සංනිවේදන වියදම් | | | | 2,344.80 | |
| ගෙවිය යුතු උපයන විට ගෙවීම් බදු ගාස්තු | | | | 15,141.70 | |
| වැඩියෙන් ගෙවා ඇති ගෙවිය යුතු ආදායම් | | | | 55,955.00 | |
| ගෙවිය යුතු මුද්දර බදු | | | | 19,275.00 | |
| ගෙවිය යුතු ස්ථාවර වත්කම් ගෙවීම | | | | 126,500.00 | |
| | | | | | 699,600.74 |

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| | | |
|---|---|---|
| **සටහනඅංක 08** | පූර්ව ගෙවීම් | |
| **2020** වර්ෂය සඳහා කලින් ගෙවා ඇති ස්මට් බලපත්‍ර ගාස්තු | **173,500.00** | |
| **2020** වර්ෂය සඳහා කලින් ගෙවා ඇති ලියාපදිංචි කිරීම් හා බලපත්‍ර ගාස්තු | **5,575,020.00** | |
| | | **5,748,520.00** |
| **සටහනඅංක 09** | ස්ථාවර තැන්පතු පොළිය | |
| ස්ථාවර තැන්පතු අංකය | පොළිය | |
| **82652562** | **36,093.49** | |
| **83504757** | **5,472.05** | |
| **81787043** | **18,310.28** | |
| **83504803** | **11,207.88** | |
| **83560278** | **25,166.73** | |
| **82652638** | **36,093.49** | |
| **82652551** | **36,093.49** | |
| **82652606** | **26,180.68** | |
| **82652648** | **93,571.05** | |
| **83986770** | **34,157.18** | |
| **82652661** | **93,571.05** | |
| **84315875** | **20,190.60** | |
| **84315923** | **13,340.07** | |
| **84315931** | **13,340.07** | |
| **85144432** | **1,639.72** | |
| **85144357** | **1,639.72** | |
| **85144467** | **1,639.72** | |
| | | **467,707.27** |
| **සටහනඅංක 10** | වෙනත් ආදායම් | |
| විමර්ෂන ගාස්තු ආදායම | **80,000.00** | |
| විමර්ෂන ලියාපසිංචි කිරීම වලින් ලාබු ආදායම | **73,500.00** | |
| බලපත්‍ර ප්‍රමාද ගාස්තු ආදායම | **37,000.00** | |
| ආයතනයෙන් බැහැර පැවැත්වූ අඛණ්ඩ වෘත්ති | **41,615.00** | |
| ප්‍රකාශණ අලවි ආදායම | **17,500.00** | |
| වැඩිපුර ගෙවීම් සඳහා ආයතනික ගාස්තු | **1,400.00** | |
| ආපදා ණය පොළිය | **22,802.52** | |
| විශේෂ අත්තිකාරම් පොළිය | **293.40** | |
| මහජනයා වෙත තොරතුරු නිකුත් කිරීම | **43,200.00** | |
| | | **317,310.92** |
| **සටහනඅංක 11** | වැඩමුළු වලින් ලද ආදායම | |
| වැඩමුළු වලින් ලද ආදායම | **2,132,500.00** | |
| වැඩමුළු වියදම | **(717,337.00)** | |
| | | **1,415,163.00** |

## ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

## ඉඩම් මැනුම් සභාව

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| | | |
|---|---|---|
| **සටහනඅංක 12** - පුද්ගල වැටුප් හා වේතන | | |
| මූලික වැටුප් | 1,178,651.09 | |
| ජීවන වියදම් දීමනාව | 280,800.00 | |
| ගැලපුම් දීමනාව | 8,256.00 | |
| සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% දායකත්වය | 176,124.85 | |
| සේවක අර්ථසාධක අරමුදල සඳහා 3% දායකත්වය | 44,031.21 | |
| | | 1,687,863.15 |
| **සටහනඅංක 13** - වෙනත් දීමනා | | |
| සභාපති සඳහා දීමනාව | 450,000.00 | |
| උප සභාපති සඳහා දීමනාව | 360,000.00 | |
| ලේකම් සඳහා දීමනාව | 143,004.00 | |
| ගණකාධිකාරි සඳහා දීමනාව | 113,581.21 | |
| විගණන හා කළමනාකරණ කමිටු දීමනාව | 65,000.00 | |
| සභාවේ දීමනාව | 736,672.00 | |
| | | 1,868,257.21 |
| **සටහනඅංක 14** - ගමන් වියදම් | | |
| අධිකරණ වෙත යාම සඳහා ගමන් වියදම් | 20,658.00 | |
| රට තුළ ගමන් වියදම් | 6,193.00 | |
| | | 26,851.00 |
| **සටහනඅංක 15** - පිරියත යන්ත්‍රෝපකරණ උපකරණ නඩත්තු කිරීම | | |
| QB ගිණුම්කරන පද්ධතිය | 8,703.66 | |
| ජායා පිටපත් යන්ත්‍රය(මාදිලිය Canon IR 2520) | 7,919.99 | |
| වෙබ් අඩවිය | 5,700.00 | |
| වායුසමීකරණ යන්ත්‍ර 03 | 28,750.00 | |
| | | 51,073.65 |
| **සටහනඅංක 16** - OTHER EXPENSES | | |
| ප්‍රචාරණ - ගැසට් නිවේදන | 98,200.80 | |
| ලැමිනේටින් ගාස්තු | 18,300.00 | |
| චෙක්පත් අගරුවීම් සඳහා අධිභාර | 699.29 | |
| භාෂා පරිවර්තන ගාස්තු | 28,640.50 | |
| දූදුණ හා බැඳීම් ගාස්තු | 5,824.00 | |
| වෙනත් විවිධ වියදම් | 829.50 | |
| | | 152,494.09 |
| **සටහනඅංක 17** - පූර්ව වර්ෂ ගැලපුම් | | |
| | | |
| අත්තිකාරම් ප්‍රතිවර්තනය 2018 සමුච්චිත අරමුදලේ ශේෂය | (3,364,537.50) | |
| වරද නිරවද්‍ය කිරීම -2018 වර්ෂයේ දී සථාවර වත්කම් මිලදී ගැනීම සඳහා සිදුකළ ගෙවීම වියදමක් ලෙස හඳුනා ගැනීම. | 27,900.00 | |
| වරද නිරවද්‍ය කිරීම -20071268 සඳහා ලැබිය යුතු විමර්ෂණ ගාස්තු 2018 වර්ෂය තුළ හඳුනා ගැනීම | 5,000.00 | |
| 2018 වර්ෂය දක්වා අත්තිකාරම් ගිණුමේ ඇතුලත්ව තිබූ හඳුනා නොගත් තැන්පතු ශේෂය මාරු කිරීම | 290,245.00 | |
| 2018 වර්ෂය සඳහා උපචිත ලේකම් දීමනා හිඟ මුදල | (9,985.25) | |
| | | (3,051,377.75) |
| | | |

# ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
# ඉඩම් මැනුම් සභාව
# පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති
# 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

**1.** පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

**1.1.** පිළියෙල කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති හා **1971** අංක **38** දරන මුදල් පනතේ විධිවිධාන වලට අනුකූලව පිළියෙල කර ඇත.

**1.2** මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම අනුව පිළියෙල කර ඇත.

**1.3.** මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සංකල්පය මත පිළියෙල කර ඇත.

**2.** දේපළ, පිරියත හා උපකරණ
හඳුනා ගැනීමේ පදනම

ඉඩම් - ඉඩම් සාධාරණ අගය මත සටහන් කර ඇත.
අනෙකුත් වත්කම් - ඓතිහාසික පිරිවැය යටතේ හඳුනාගැනේ.

**2.1.** දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කිරීමෙන් පසු නැවත අයකර ගත හැකි අගයට ගිණුම් ගත කරනු ලැබේ.

**2.2.** ක්ෂය කිරීම්

හීනවන ශේෂ ක්‍රමයට පහත අනුපාතික යටතේ ඉකුත් වර්ෂය හා අනුකූලව ක්ෂය කිරීම් දක්වා ඇත.

| වත්කම් වර්ගය | % |
|---|---|
| යන්ත්‍රෝපකරණ | 20 |
| ගෘහභාණ්ඩ | 10 |
| පරිගණක හා උපාංග | 25 |
| කාර්යාලීය උපකරණ | 25 |
| ඉඩම් මැනුම් සභාවේ නාම පුවරුව | 20 |
| ගොඩනැගිලි හා ව්‍යුහ (වෙන් කිරීම) | 20 |
| ගිණුම්කරණ මෘදුකාංග | 10 |

**3.** බැංකුවල ඇති තැන්පතු හා බැංකුවේ ඇති මුදල්
බැංකු වල ඇති තැන්පතු සම්පූර්ණ වශයෙන්ම සමන්විත වනුයේ ලංකා බැංකුවේ පවත්වාගෙන යන ස්ථාවර තැන්පතු හා ඒක්ෂණ තැන්පතු වශයෙනි.
කෙටි කාලීන වශයෙන් කල් පිරෙන එනම් අත්පත් කරගත් දිනයේ සිට මාස **03**ක් හෝ ඊට අඩු කාලයක් තුළ කල් පිරෙන ආයෝජන ද මුදල් හා මුදල් සමාන ද වශයෙන් සලකනු ලැබේ.

**4.** ප්‍රත්‍යාගණන සංචිතය
ඉඩම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් ලැබෙන ලාභයෙන් ප්‍රත්‍යාගණන සංචිතය සමන්විත වේ.

## 12. විගණකාධිපති වාර්තාව 2019

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. ජීඑල්/බී/එල්එස්සී/01/19/02 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2020 සැප්තැම්බර් 23 දින

සභාපති

ඉඩම් මැනුම් සභාව

**ඉඩම් මැනුම් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ඉඩම් මැනුම් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවියයුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

අවධානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇති වීමට හේතු වේ.

- අවස්ථාචෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යයන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේනම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට අයිමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකුට සභාව සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

| නීති රීති/ විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (අ) 2002 ඔක්තෝබර් 04 දිනැති අංක 17 දරන ඉඩම් මැනුම් පනතේ 43(1) හා (2) වගන්ති | සභාව විසින් සෑම වර්ෂයකම මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර සියලුම ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරුන්ගේ නම් ලැයිස්තුවක් ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය |

| | |
|---|---|
| | යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරුන්ගේ සංඛ්‍යාව 1041 ක්ව තිබියදී 2019 මාර්තු 29 දිනැති අංක 2117 දරන ගැසට් පත්‍රයේ මිනින්දෝරුවරු 858 දෙනෙකුගේ නම් පමණක් පළ කර තිබුණි. |
| (ආ) 2018 මාර්තු 26 දින 221 වෙනි සභා රැස්වීම් තීරණය | සභාවේ ලියාපදිංචි නොවී මැනුම් කටයුතු සිදුකරන සුදුසුකම් නොලත් පුද්ගලයින් සම්බන්ධයෙන් සොයා බැලීමට පොලිස්පතිවරයා දැනුවත් කිරීමට තීරණය කර තිබුණ ද එම තීරණය අනුව කටයුතු කර නොතිබුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**03. වෙනත් විගණන නිරීක්ෂණ**

(අ) පුරප්පාඩුව පවතින ලේකම් තනතුරට නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කරන ලෙසට 2012 ජූලි 05 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර තිබුණද එම තනතුර පිරවීමට 2020 ජුනි 30 දක්වාම කටයුතු කර නොතිබුණි. තවද පැමිණිලි විසඳීමේ හා ලිපිගොනු යාවත්කාලීන කිරීමේ කටයුතු, ගිණුම්කරණ කටයුතු සහ මහජන සම්බන්ධතා පවත්වා ගැනීමේ කටයුතු සඳහාත් නිලධාරීන් බඳවාගෙන නොතිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව සභාව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2017 හා 2018 වර්ෂ

සඳහා කාර්යසාධන වාර්තා 2020 ජූලි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය විෂමාචාර පිළිබඳව මහජනතාවගෙන් ලැබී විසඳීමට තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව 103 ක් වුවද වර්ෂය තුළ විසඳා තිබුණේ පැමිණිලි 54 ක් හෙවත් සියයට 52 ක ප්‍රමාණයක් පමණි.

(ඇ) සභාව විසින් ලේඛන හෝ පොත්පත් යනාදිය විධිමත්ව පවත්වා නොතිබීම හේතුවෙන් ආදායම් ප්‍රභවය නිශ්චිතව හඳුනාගත නොහැකිව තිබුණු රු.338,225 ක ශේෂයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ ආදායම් පෙර ලැබීම් (Income Received in Advanced) යනුවෙන් දක්වා ඇති ශේෂයට එකතුකර තිබුණි.

(ඉ) අයවැය ලේඛනයේ පුහුණු දීමනා සහ පුහුණු වියදම් සඳහා රු.290,000 ක්ද, ලී බඩු හා කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා රු.205,000 ක්ද, ප්‍රතිපාදනය කර තිබුණද යථෝක්ත අරමුදල් උපයෝජනය කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති